NALANDA VIDYALAYA COLOMBO 10

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණය

NALANDA VIDYALAYA COLOMBO 10

| 11 ශ්‍රේණිය | බුද්ධ ධර්මය | 16 ඒකකය |
| --- | --- | --- |

## නිමල දහම රකුණු අයුරු

- **සියළු ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

01. නිවැරදි පිළිතුර ලකුණු කරන්න.

1. ''විනයෝ නාම සාසනස්ස ආයු'' යන්නෙහි අදහස වන්නේ,
   - i. ශාසනයේ අයුෂ පවතින්නේ උභතෝ සංඝයා නිසාය
   - ii. ශාසනයේ ආයුෂ පවතින්නේ සංඝයා නිසාය
   - iii. ශාසනයේ ආයුෂ පවතින්නේ විනය නිසාය
   - iv. ශාසනයේ ආයුෂ පවතින්නේ දහම නිසාය

2. පළමු ධර්ම සංගායනාව බුද්ධ පරිනිර්වාණයෙන් පවත්වනු ලැබුවේ,
   - i. මාස 02ට පසුවය
   - ii. මාස 03ට පසුවය
   - iii. මාස 04ට පසුවය
   - iv. මාස 05ට පසුවය

3. ත්‍රිපිටකට පිළිවෙලින් ඇති වරණය වන්නේ,
   - i. විනය, සූත්‍ර, අභිධර්ම
   - ii. අභිධර්ම, සූත්‍ර, විනය
   - iii. සූත්‍ර, අභිධර්ම, විනය
   - iv. සූත්‍ර, විනය, අභිධර්ම

4. පළමු සංගායනාව හඳුන්වන තවත් නමක් වනුයේ,
   - i. පංචසතිකා
   - ii. ද්විහස්සික
   - iii. සත්තසතිකා
   - iv. සාහස්සිකා

5. දෙවන ධර්ම සංගායනාවේ මූලිකත්වය ලබාගත් මහරහතන් වහන්සේ වනුයේ,
   - i. මහා කාශ්‍යප මහ තෙරුන්ය
   - ii. මොග්ගලීපුත්ත තිස්ස තෙරුන්ය
   - iii. අනඳ මහ තෙරුන්ය
   - iv. සබ්බකාමී මහ තෙරුන්ය

6. පුස්තකාරූඪ සංගායනාව ලෙස හඳුන්වන්නේ,
   - i. රජගහනුවර සප්තපර්ණි ගුහාව තුළ පැවැත්වූ ධර්ම සංගායනාව
   - ii. විශාල මහනුවර වාළුකාරාමයේදී පැවැත්වූ ධර්ම සංගායනාව
   - iii. මාතලේ අළුවිහාරයේදී පැවැත්වූ ධර්ම සංගායනාව
   - iv. විද්‍යාලංකාර පිරිවෙනේදී පැවැත්වූ ධර්ම සංගායනාව

7. අභිධර්ම පිටකයට අයත් ග්‍රන්ථයක් නොවන්නේ මින් කුමන වර්ණයද?
   - i. විභංගප්පකරණය, ධාතුකථාප්පකරණය, යමකප්පකරණය
   - ii. පට්ඨානප්පකරණය, ධාතුකතාප්පකරණය, කථාවත්ථුප්පකරණය

iii. විභංගප්පකරණය, ධම්මසංගණිප්පකරණය, පුද්ගලපඤ්ඤත්තිප්පකරණය

iv. පුද්ගලපඤ්ඤත්තිප්පකරණය, ධම්මසංගීති, කථාවත්ථුප්පකරණය

8. ධර්මාශෝක රජුගේ ධර්ම ව්‍යාප්තියෙන් බුරුමයට ථේරවාද දහම වැඩම කරවූයේ,

i. සෝණ, උත්තර තෙරුන් වහන්සේලා

ii. මහාදේව තෙරුන්ය

iii. මහා මහින්ද තෙරුන්ය

iv. රක්ඛිත තෙරුන්ය

9. තම්බපණ්ණියට වැඩම කළ මහා මහින්ද තෙරුන් දේශිත පළමු දේශනාව වනුයේ,

i. ආසිවිසෝපම සූත්‍රය

ii. දේවදූත සූත්‍රය

iii. මහා මංගල සූත්‍රය

iv. චුල්ලහත්ථිපදෝපම සූත්‍රය

10. භාණක පරපුර හෙවත් ධර්මය මුඛ පරම්පරාගතව පවත්වාගෙන යෑමේදී ඛුද්දක නිකාය පවත්වාගෙන යාමට හිමි වූයේ,

i. අනඳ තෙරුන්ටය

ii. සැරියුත් මහ තෙරුන්ටය

iii. මුගලන් මහ තෙරුන්ටය

iv. සියළුම භික්ෂූන් වහන්සේලාටය

02. I. ධර්ම සංගායනාවක් යනු කුමක්දැයි සඳහන් කරන්න.

II. පළමු ධර්ම සංගායනාව පැවැත්වීමට ප්‍රධාන හේතුව සඳහන් කරන්න.

III. ධර්ම සංගායනා පැවැත්වීමෙන් ථේරවාදී දහම ආරක්ෂාවීමට ප්‍රධාන ලෙසම ඉවහල් විය. පැහැදිලි කරන්න.

03. I. පුස්තකාරූඪ ධර්ම සංගායනාවට සහභාගී වූ රහතන් වහන්සේලා ගණන කොපමණද?

II. ඉහත සංගායනාව පැවැත්වීමට හේතුව සඳහන් කරන්න.

III. අතිතයේදි නිර්මල දහම ආරක්ෂා කළ සේම වර්තමානයේදීද අප සිව්වනක් පිරිස සතු වගකීම කෙබඳුදැය පැහැදිලි කරන්න.